# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
## අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

ක්‍රීඩා ක්ෂේත්‍රය හා පරිපාලනය පිළිබඳව අත්දැකීම් සහිත දැනට රාජ්‍ය සේවයේ නියුතු දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ට, ඒ හා සමාන සුදුසුකම් සහිත ත්‍රිවිධ හමුදාවන්හි හා ශ්‍රී ලංකා පොලිසියේ සේවයේ නියුතු/විශ්‍රාමික නිලධාරීන්ට සහ ඒ හා සමාන සුදුසුකම් සහිත පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වූවන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සහ විශ්‍රාමික ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 57 ට නොවැඩි විය යුතු අතර, පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා වයස් සීමාව, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 45 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

නිසි ලෙස සකස් කළ අයදුම්පත (අයදුම්කරු දැනට රාජ්‍ය සේවයේ නියුතු දීප ව්‍යාප්ත සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු නම් ඔහුගේ/ඇයගේ අයදුම්පත අදාළ අමාත්‍යාංශයේ /පළාත් සභාවේ /ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි නිර්දේශ සහිතව හා අයදුම්කරු දැනට ත්‍රිවිධ හමුදා සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිසියේ සේවයේ නියුතු වන්නේ නම් ඔහුගේ/ඇයගේ අයදුම්පත අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව) ජීව දත්ත පත්‍රයද සමග 2025 ඔක්තෝම්බර් මස 24 දින හෝ ඊට පෙර පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම" ලෙස සඳහන් කළ යුතුය.

ලිපිනය: ලේකම්, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය,
නො: 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ - 07.

අයදුම්පත්‍රය QR කේතය ස්කෑන් කර ලබාගත හැකිය.

විමසීම: 011 2680174
ලේකම්, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
දිනය: 2025.10.03